*සැ. යු.* - 2022.08.19 වැනි දින පළ වූ 2294 දරන *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,295 - 2022 අගෝස්තු මස 26 වැනි සිකුරාදා - 2022.08.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 194 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 194 |


*සැ. යු.* - (i) සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය පනත් කෙටුම්පත 2022 අගෝස්තු මස 05 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

(ii) ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත 2022 අගෝස්තු මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 සැප්තැම්බර් මස 16 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 සැප්තැම්බර් මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


193 - B 082376- 353 (2022/08)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාත් සභාවේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය - බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් දිසානායක මුදියන්සේලාගේ අනුර කුමාර දිසානායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1987 මැයි 18 වැනි දින ප්‍රදානය කර ඇති අංක කුරු/ප්‍ර/16984 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කිරින්දව, කිරින්දව පදිංචි වික්‍රමසිංහ මුදියන්සේලාගේ ඩිංගිරි බණ්ඩා වෙත ප්‍රදානය කොට කුලියාපිටිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කුලි/කේ/7/291 යටතේ 1987 දෙසැම්බර් මස 23 දින ලියාපදිංචි කරනු ලැබ ඔහුගේ ඇවෑමෙන් වික්‍රමසිංහ මුදියන්සේලාගේ සේනාරත්න බංඩාර යන අය වෙත කුළි/බී/5/80 හා 2020.11.12 වැනි දින මුල් අයිතිය ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022.09.26 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ, කුළියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යටිකහ දකුණු කෝරළයේ 1143 කිරින්දව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කිරින්දව නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 7 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි කුරුණෑගල මිනුම් අධිකාරි විසින් සම්පාදිත අංක 2353 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 243 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.382 විශාලත්වය ඇත්තාවූ ද, නිකලන්ද හේන නමැති පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 242 සහ 136, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 136 සහ 244, |
| *දකුණට* | : | කැබලි අංක 244, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 125 සහ 242. |

ඩී. එම්. ඒ. කේ. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
කුලියාපිටිය (බටහිර).

2022 අප්‍රේල් මස 26 වැනි දින

08-222

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/12295.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : ප. ඉ. කො./කො/6/කො/138.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 472 ඒ - පහළ බෝමිරිය ග්‍රාම නිලධාරි වසමේ, පහල බෝමිරිය ගමේ Kaduwela DS Divi/2012/11/01 අනුරේඛනයේ හි කැබලි අංක "A" න් දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 86ක් පමණ වන රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා යසලාල් ලක්සිරි වික්‍රමාරච්චි මහතා විසින් විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 01, CO/KDW/2007/271 අනුරේඛනයේ කැබලි අංක 02 හා 04 කොටස්, |
| නැගෙනහිරට | : | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පාර හා කැබලි අක්ෂර ඩී, |
| දකුණට | : | කැබලි අක්ෂර ඩී, |
| බටහිරට | : | කැබලි අක්ෂර ඞී. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) බදු කාලය .- අවුරුදු තිහයි (30) (ගරු ඇමතිතුමා බදු අනුමත කළ 2022.06.06 දින සිට වසර 30ක් ඉදිරියට).

වාර්ෂික බදු මුදල.- 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එයට කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

වාර මුදල. - වාර මුදලක් අය නොකෙරේ.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු එකක් (01) ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

(ඉ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බදු අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2022.06.06 වැනි දින සිට වසර 05 ක් ගතවන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(ඌ) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එන්. එම්. ටී. ජානිකා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

2022 අගෝස්තු මස 09 වැනි දින,
අංක 1200/6 හි, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-223

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/27850.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : පළාත්/ඉ. කො./06/කො/390.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 519 නුගේගොඩ ග්‍රාම නිලධාරි වසමේ පාගොඩ ගමේ මු. පි. කො. 7826 පිඹුරේ කැබලි අංක 49 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0066 ක් නේවාසික කටයුතු සඳහා වෙලේ පේඩිගේ ප්‍රියන්ත මහතා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ :

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 48 සහ 36, |
| නැගෙනහිරට | : | කැබලි අංක 36, |
| දකුණට | : | කැබලි අංක 59 සහ 2, |
| බටහිරට | : | කැබලි අංක 2 සහ 48. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) බදු කාලය .- අවුරුදු තිහයි (30) (1995.06.15 සිට 2025.06.14 දක්වා).

වාර්ෂික බදු මුදල.- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි.

දඩ මුදල. - ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු එකක් (01) ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඈ) ප්‍රාදේශීය ලේකම්/ස්කෝපින් කමිටුව/ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බදු ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 1995..06.15 දින සිට වසර 05ක් ගත වන තුරු පවුල පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. මෙම බදුකරය සඳහා දීමනා පත්‍රයක් ලබාගැනීමේ හිමිකම 1995.06.15 දින සිට වසර 05ක් ගතවීමෙන් පසු හිමිවේ.

(ඵ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

ගැසට් නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එන්. එම්. ටී. ජානිකා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

2022 අගෝස්තු මස 10 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැඳුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-224

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/27861.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : පළාත්/ඉ. කො./06/කො/390.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 519 නුගේගොඩ ග්‍රාම නිලධාරි වසමේ පාගොඩ ගමේ මු. පි. කො. 7826 පිඹුරේ කැබලි අංක 66 ලෙස දක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0065 ක් වූ ඉඩම් කොටස නේවාසික කටයුතු සඳහා නාවල පරම්බිල් උදයකුමාර මහතා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| උතුරට | : | මාර්ග සංවර්ධන අධිකාරිය, |
| නැගෙනහිරට | : | කැබලි අංක 65 සහ 67, |
| දකුණට | : | කැබලි අංක 71, |
| බටහිරට | : | මාර්ග සංවර්ධන අධිකාරිය. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) බදු කාලය .- අවුරුදු තිහයි (30) (1995.06.15 සිට 2025.06.14 දක්වා).

වාර්ෂික බදු මුදල.- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි.

දඩ මුදල. - ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු එකක් (01) ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඈ) ප්‍රාදේශීය ලේකම්/ස්කෝපින් කමිටුව/ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බදු ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 1995..06.15 දින සිට වසර 05ක් ගත වන තුරු පවුල පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. මෙම බදුකරය සඳහා දීමනා පත්‍රයක් ලබාගැනීමේ හිමිකම 1995.06.15 දින සිට වසර 05ක් ගතවීමෙන් පසු හිමිවේ.

(ඵ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

ගැසට් නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එන්. එම්. ටී. ජානිකා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

2022 අගෝස්තු මස 10 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැඳුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-225

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.